සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

6838

9 - ශ්‍රේණිය

පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ............................................................ කාලය : පැය 01 1/2 යි.

## I කොටස

**වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) සංගීත ප්‍රසංගයක දී භාණ්ඩයක නාදයේ ගුණාත්මක භාවය සකසා ගැනීමට භාවිතා කරන තාක්ෂණික මෙවලම කුමක් ද?
1. මයික්‍රෆෝනය 2. මික්සරය 3. ඇම්ප්ලිෆයර් 4. ස්පීකර්

02) බීම්පලාසි රාගය සම්බන්ධයෙන් නිවැරදි කියමන කුමක් ද?
1. ආරෝහණයේ ස්වර 5ක් යෙදේ.
2. අවරෝහණයේ ස්වර 5ක් යෙදේ.
3. ආරෝහණයේ ස්වර 7ක් යෙදේ.
4. ආරෝහණයේ සහ අවරෝහණයේ ස්වර 5 බැගින් යෙදේ.

03) නිස /මගුරි /ස - / පුනිස යනුවෙන් ආරම්භ වන සර්ගම් එක අයත් රාගය වන්නේ,
1. බිලාවල් 2. භූපාලි 3. යමන් 4. බීම්පලාසි

04) ඉහත සඳහන් සර්ගම් පාදය සඳහා වැයීමට සුදුසු තාලය කුමක් ද?
1. දාදරා 2. ත්‍රිතාල් 3. ජප්තාල් 4. දීප්චන්දි

05) සරිගම යන ස්වර මධ්‍යම භාවයෙන් ලියා ඇති නිවැරදි ස්වර ඛණ්ඩය කුමක් ද?
1. සනිධප 2. මපධනි 3. සනිධප 4. මපධනි

06) ජන සංගීතය ඇසුරු කර නිර්මාණය වී ඇති සරල ගීතයකි.
1. මල්සරා බැල්ම හෙලා 2. රත්න දීප ජන්මභූමි
3. ලංකා ලංකා පෙම්බර ලංකා 4. මේ සිංහල අපගෙ රටයි.

07) දෙවියන්ගේ ගුණ ගැයෙන හින්දු භක්තිකයන් අතර ප්‍රචලිත ගායන ශෛලියකි,
1. භජන් 2. තරාණා 3. ගසල් 4. ඛ්‍යාල්

08) දේශාභිමානී ගීතයක් නොවන්නේ මින් කුමක් ද?
1. ලංකා ලංකා පෙම්බර ලංකා 2. රුවන් නිදන හෙළ බිමයි
3. ඕලු පිපිලා 4. හෙළ ජාතික අභිමානේ

09) පිරිමින් පමණක් ගායනය කළ ගැමි ගී වර්ගයකට උදාහරණයකි.
1. නෙළුම් ගී 2. ගොයම් ගී 3. කුරක්කන් ගී 4. කමත් ගී

10) විතතාතත ගණයට අයත් අවනද්ධ වාදන භාණ්ඩයකි.
1. දවුල 2. තම්මැට්ටම 3. යක්බෙරය 4. ගැටබෙරය

11) නව නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භක යුග පුරුෂයෙකි.
1. මහගමසේකර 2. එදිරිවීර සරච්චන්ද්‍ර
3. ජෝන් ද සිල්වා 4. ඩබ්ලිව්.බී. මකුලොලුව

12) ගිටාරයෙහි ඉහළ හා පහළ වශයෙන් එකම ස්වරයකට සුසර කරනු ලබන තත් දෙකකි. එම තත්වල අංක පිළිවෙළින්,
1. 1 සහ 6 2. 1 සහ 2 3. 2 සහ 6 4. 2 සහ 3

13) දකුණතින් තනුවත්, වමතින් බේස් වාදනයත් කෙරෙන සුෂිර ගණයට අයත් ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි.
1. සර්පිනාව 2. මෙලෝඩිකාව 3. එකෝඩියනය 4. පියානෝව

14) පෙරදිග සංගීත ප්‍රස්තාරකරණයේ දී විරාම ස්ථානය නොහොත් අවග්‍රහය දැක්වීමට බටහිර සංගීතයෙහි යොදන සංකේතය කුමක් ද?
1. Tie Mark (ටයි මාර්ක්) 2. Rest Mark (රෙස්ට් මාර්ක්)
3. Treble clef (ට්‍රෙබල් ක්ලෙෆ්) 4. Time signature (ටයිම් සිග්නේචර්)

15) දෙවොල් බෙරය යනුවෙන් ව්‍යවහාර කරන අවනද්ධ වාද්‍ය භාණ්ඩය කුමක් ද?
1. ගැටබෙරය 2. දවුල 3. තම්මැට්ටම 4. යක්බෙරය

16) Soprano නමැති හඬතලයට අදාළ වාද්‍ය භාණ්ඩය කුමක් ද?
1. වයලීන් 2. වියෝලා 3. චෙලෝ 4. ඩබල්බේස්

17) කැලිප්සෝ සංගීතය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩයකි.
1. තාම්පුරාව 2. ගිටාරය 3. එස්රාජය 4. වයලීනය

18) විද්‍යුත් අවනද්ධ වාද්‍ය භාණ්ඩයකට උදාහරණයකි.
1. ගිටාරය 2. ඉගනය 3. ඔක්ටපෑඩය 4. සින්තසයිසරය

19) 'අන්න බලන් සඳ' යන ගීතය ඇතුළත් ගීත නාට්‍යය වන්නේ,
1. දෙපානෝ 2. කුණ්ඩලකේශී 3. ප්‍රේමතෝ ජායතී සෝකෝ 4. මනමේ

20) ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න සංගීත අධ්‍යක්ෂණය කළ නාට්‍යයකි.
1. හුණුවටය 2. නරි බැනා 3. සිංහබාහු 4. කුණ්ඩලකේශී

(ලකුණු 20)

## II කොටස

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01) (i) භීම්පලාසි හෝ යමන් රාගයට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ලකුණු 06
(ii) ඉහත රාග දෙකට අයත් ස්වර සංගති දෙකක් ලියා දක්වන්න. ලකුණු 04

02) (i) විද්‍යුත් ගිටාර් වර්ග තුනක් නම් කරන්න. ලකුණු 03
(ii) බොක්ස් ගිටාරයේ තත් සුසර කරන ආකාරය තතට හිමි අංකය යොදා ඒ ඉදිරියෙන් ලියා දක්වන්න. ලකුණ 03
(iii) ගිටාරයක දළ රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න. ලකුණු 04

03) (i) ගැමි ගීත නිර්මාණයට පාදක වූ හේතු සාධක තුන නම් කරන්න. ලකුණු 03
(ii) ඉහත හේතු සාධක තුන අනුව ගැමි ගී වර්ග කර දක්වන්න. ලකුණු 03
(iii) ගැමි ගීතවල ලක්ෂණ හතරක් ලියන්න. ලකුණු 04

04) (i) භජන් ගායන ශෛලිය පිළිබඳ තොරතුරු හතරක් ලියා දක්වන්න. ලකුණු 04
(ii) කව්වාලි ගායන ශෛලිය පිළිබඳ තොරතුරු හතරක් ලියා දක්වන්න. ලකුණු 04
(iii) භජන් හෝ කව්වාලි ගීතයක මුල් පාද දෙක ලියා දක්වන්න. ලකුණු 02